Department of Education,Sabaragamuwa Province/ Weekly School

**නිපුණතාවය :-** කුඩා පරිමාණ ව්‍යාපාරයක ව්‍යවසායකයකු විසින් ඉටු කරන භූමිකා විමර්ශණය කරයි.

**නිපුණතා මට්ටම :-** කුඩා පරිමාණ ව්‍යාපාරයක් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා ව්‍යවසායකයකු විසින් වර්ධනය කරගත යුතු කළමනාකරණ සහ නායකත්ව කුසලතා අනාවරණය කරයි.

**( පෙළ පොතේ පිටු අංක 55 සිට 57 දක්වා හොඳින් කියවා පහත ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න)**

(01) සංවිධානයේ පුද්ගල කණ්ඩායම් සමඟ එකට කටයුතු කිරීමේ හැකියාව ව්‍යවසායකයකුට වැදගත්වේ.එම හැකියාව නොමැති වීමෙන් ව්‍යවසායකයකු මුහුණදෙන ගැටලු දෙකක් දක්වන්න.

(02) ආයතනය පුරා තොරතුරු බෙදාහැරීම , අවශ්‍ය තොරතුරු රැස්කිරීම සන්නිවේදන කුසලතා නම් වේ.ආයතනයට සන්නිවේදන කුසලතා වල වැදගත්කම පැහැදිලි කරන්න.

(ii) සංවිධානයක විධිමත්ව තොරතුරු ගලා නොයාම , අවිධිමත්ව තොරතුරු ගලායාමට හේතුවේ. ඔබ එකඟ වන්නේ ද ?

(03) උපදේශණ කුසලතා යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද ?

(04) සේවකයන්ට , ආයතනයක් තුළින් පැනනගින ගැටලු වලට විසඳුම් ලබාදීම අවශ්‍ය වන්නේ ඇයි ? එම කාර්යභාරය හඳුන්වන්නේ කුමන කුසලතාවයක් ලෙස ද ?

(05) ව්‍යවසායකයකුට සැමවිටම මූලිකත්වය ගෙන ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතාව පැවතිය යුතුය. එලෙස ක්‍රියාකළ යුතු අවස්ථා 02 ක් දක්වන්න.

(06) කුසලතා වර්ධනය කර නොගත් ව්‍යවසායකයකු තුළ දැකිය හැකි ලක්ෂණ 04 ක් දක්වන්න.

(07) පහත දී ඇති වරණ අතුරෙන් ව්‍යවසායකත්ව කුසලතාවයක් නොවන්නේ,

i. තාක්ෂණික කුසලතා
ii. දේශපාලන කුසලතා
iii. මානව කුසලතා
iv. ආදර්ශවත්ව කටයුතු කිරීමේ කුසලතා